කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය– 2016/2017
දෙවන සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

# ECN: 1204ලෝක ආර්ථික සංවර්ධනය සහ ශ්‍රී ලංකාව

කාලය- පැය දෙකයි (02)

**ඕනෑමප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

**ප්‍රශ්න අංක 01**

I. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කාලයේ ඇති වූ හරිත විප්ලවයෙහි ආර්ථික බලපෑම් ඔබ විස්තර කරන්නේ කෙසේද ? (ලකුණු 12 )

II. "රටක ආර්ථික සංවර්ධනයේදී කෘෂිකර්මාන්තය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි."සුදුසු උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 13 )

**ප්‍රශ්න අංක 02**

I. "ලෝක ආර්ථික ඉතිහාසය තුළ කාර්මික විප්ලවය ප්‍රධාන හැරවුම් ලක්ෂයක් ලෙස සලකනු ලබයි."ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 13 )

II. රටක කාර්මික සංවර්ධනය සඳහා දායක වන ප්‍රධාන සාධකයන් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 12 )

**ප්‍රශ්න අංක 03**

I. රෝස්ටෝව්ගේ වර්ධන ආකෘතියෙහි(Rostow's growth model) සංවර්ධන අවස්ථාවන් පහ (5) සුදුසු උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 13 )

II. වෙළඳපොළ ආර්ථිකයක් තුළ රජයේ කාර්යභාරය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 12)

**ප්‍රශ්න අංක 04**

I. ලෝක ආර්ථික පරිවර්තනයන විශ්ලේෂණය කිරීමේදී නවීකරණ න්‍යායන්වල ඇති වැදගත්කම හඳුනා ගන්න. (ලකුණු 12 )

II. ඌන සංවර්ධිත රටවල සංවර්ධන අත්දැකීම් විශ්ලේෂණය කිරීමේදී නවීකරණ න්‍යායන් කොතෙක් දුරට යෝග්‍ය වන්නේද? (ලකුණු 13 )

**ප්‍රශ්න අංක 05**

"ආර්ථික සංවර්ධනය යනු රටක ගුණාත්මක ඉලක්ක සාක්ෂාත් වන අතර ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මක සාධකයක් වෙයි."

I. ආර්ථික වර්ධනයේ සහ ආර්ථික සංවර්ධනයේ දර්ශකයන් පැහැදිලි කරන්න. (ලකුණු 12 )

II. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන සහ සංවර්ධන සාධකයන් පිළිබඳ පිළිබඳ ඔබගේඇගයීම කුමක් වේද? (ලකුණු 13 )

**ප්‍රශ්න අංක 06**

"මාගේ ශ්‍රී ලංකා පළමු සංචාරය 1956 අප්‍රේල් මස ලන්ඩන් බලා යන අතරතුර දී සිදු විය. මා කොළඹ නගරය ගමන් කරන විට පොදු ගොඩනැගිලි සහ යුද්ධයෙන් විනාශ නොවූ අනෙකුත් රමණීය දේවල් දැක පුදුමයට පත්විය.ඒ වන විට, සිංගප්පූරුවට වඩා බොහෝ සම්පත් සහ වඩාත් හොඳ යටිතල පහසුකම් ශ්‍රී ලංකාවේ තිබුණි." [ Lee Kuan Yew (2000): *The Singapore Story*, p.460 ]

I. සිංගප්පූරුවේ අගමැතිව සිටි ලී ක්වාන් යූ මහතා සිදු කළ ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද? (ලකුණු 12)

II. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල අදායම ඇමරිකානු ඩොලර් 4000ට අඩු වන අතර සිංගප්පූරුවේ එය ඇමරිකානු ඩොලර් 50000ට වඩා ඉහල වේ. සිංගප්පූරුව සමඟ සංසන්දනය කරන විට ශ්‍රී ලංකාවේ මන්දගාමී ප්‍රගතියක් පවතින්නේ යැයි ඔබ හිතන්නේ ඇයි? (ලකුණු 13)

**ප්‍රශ්න අංක 07**

අනෙකුත් බොහෝ සංවර්ධනය වෙමින් පවතින ආසියාතික රටවල් මෙන්ම, ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රශ්න වලට විසඳුම් ලෙස සහ ආර්ථික සංවර්ධනය ලබා කර ගැනීමට උපක්‍රමයක් ලෙස ආනයන ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කිරීමට තෝරා ගන්නා ලදී .

I. ආනයන ආදේශ ප්‍රතිපත්ති ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 12 )

II. මෙම ප්‍රතිපත්තීන් රටේ ආර්ථික අරමුණු ලබා කර ගැනීමට අසමත් වූයේ ඇයි? (ලකුණු 13 )

**ප්‍රශ්න අංක 08**

1977 දී ශ්‍රී ලංකාවවෙළෙඳලිහිල්කරණයක් ඇති විවෘත ආර්ථිකයක් බවට පත් විය.

I. 1977 න් පසුව ශ්‍රී ලංකාව අනුගමනය කරනු ලැබූ ප්‍රධාන විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් මොනවාද? (ලකුණු 13 )

II. විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ පසුගිය වසර හතලිහක කාලය තුළසැලකිව යුතු ආර්ථික ප්‍රගතියක් ඇතිවූයේ දැයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ලකුණු 12 )

**ප්‍රශ්න අංක 09**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ට අනුව, වර්තමානය වන විට ශ්‍රී ලංකාවට බොහොමයක් අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත.

I. එම ආර්ථික අභියෝගයන් මොනවාද? ඒවායෙන් අඩුම වශයෙන් දෙකක්වත් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 12)

II. එම අභියෝගයන් සාර්ථකව මගහරවා ගැනීමට සහ ආර්ථිකය තිරසාර වර්ධන මාවතකට යොමු කිරීමට ඔබ යෝජනා ඉදිරිපත් කරන්නේ කෙසේද? (ලකුණු 13)